

පුංචි සිතේ මැවුණු ගී
එන්.චතුනි ඉමායා
කතෘ

# පුංචි සිතේ මැවුණු ගී

## එන්.වනුති ඉමායා

## කතෘ

### කතෘගේ වෙනත් කෘති

- මගේ පුංචි සුරංගනාවි - 2023
- මගේ සිත් රූ - 2024

මහ/මහාමායා බාලිකා විද්‍යාලය
5 ශ්‍රේණිය A

ISBN – 978-624-208-995-9

# පිදුම

ගත් කතුවරියක් ලෙස

ලොව දකින්නට

මා හට මගපෙන්වූ

මහමායා බාලිකා විදුමවිනි

ඔබට මම මෙම පොත

ආදරයෙන් පුදමි....



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදු කරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහු විධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොතේ ලියන්නට යොමු කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධිර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.
අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැප වූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී. එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත,
සම්මානිත මහාචාර්ය,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය,
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල් වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැප වූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථ කරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# පටුන


- මගේ පාසල 01
- මගේ ගුරුතුමී 02
- දහම් පාසල 03
- මගේ අම්මා 04
- මගේ අප්පච්චි 05
- මගේ ගෙවත්ත 06
- මගේ නංගී 07
- මගේ යෙහෙළිය 08
- රාත්‍රිය 09
- මගේ සුරතලා 10

# මගේ පාසල

දළදා සෙවණේ අබියස
බුදු සම්දුගෙ සෙවණේ යට
ලොවම දන්න මගෙ පාසල
මහාමායා බාලිකා ....

සිප් සයුරේ අප නහවා
යහගුණ දම් අපට පොවා
අපයහ මග ගෙනියනවා
මහාමායා බාලිකා .....

ක්‍රීඩා තරු බිහි කරන්න
සංගීතෙන් තරු මවන්න
හරි දක්ෂයි මගෙ විදුමව
මහාමායා බාලිකා .....

රටට දැයට වෙහෙස වෙනා
හොඳ දරුවෙකු බිහි කරන්න
සැමදා වෙහෙසෙනවා ඔබ
මහාමායා බාලිකා .....

# මගේ ගුරුතුමී

පාන්දරින් ඉස්කෝලෙට
පාට පාට ඔසරි ඇදන්
කඩිසර ගමනින් වඩිනා
මගේ ගුරුතුමී .....

හනි හනිකට ගණන් හදයි
අවට ලෝකෙ ගැන පහදයි
සිහල දෙමළ හොඳින් දනී
මගේ ගුරුතුමී .....

පාඩම් වැඩ කරන ගමන්
යහමගටත් හුරු කරමින්
දෙවෙනි මවක් වාගේ මට
මගේ ගුරුතුමී .....

පැටියෝ මැණිකෙ කියා අපට
හරි ආදරයෙන් අමතන
අමිතා මැඩම් තමයි ඉතින්
මගේ ගුරුතුමී ......

# දහම් පාසල

බෝ සෙවණේ මෙත් සිසිලයි
චෛත්‍යයේ සුදු පැහැයයි
විහාර ගෙය මල් සුවඳයි
දහම් පාසලේ .....

ලොකු සාදු නිතර අපිට
යහගුණ දම් කියා දෙන්ට
උදේ දිවා රෑ වෙහෙසෙයි
දහම් පාසලේ .....

පෝය දාට වෙසක් දාට සෙනග මහ ගොඩයි
අටපට්ටම් පහන් කූඩු ලස්සනට දිලෙයි
සාදු සාදු නාද දෙමින් බොදු හඬ පැතිරෙයි
දහම් පාසලේ .....

පස් පව් දුරලා ඉන්නට
කුසල් දහම් වඩවන්නට
නිරතුරුවම අපට කියයි
දහම් පාසලේ .....

## මගේ අම්මා

දසමස මා කුසේ තියන්
දුක් ගින්දර හිසේ දරන්
මා මෙලොවට බිහි කළ මගේ
ආදර අම්මා .....

ලේ කිරි කර දී මා හට
ඇති දැඩි කළ ඈ එඩිතර
මිණි පහනක් වාගේ මට
මගෙ ආදර අම්මා .....

මගෙ ඉගෙනුම සොයා බලන
නිතරම හොඳ ඔවදන් දෙන
පාසල් වැඩ සොයා බලන
මගෙ ආදර අම්මා .....

මගෙ ලෝකයෙ රැජින ඇයයි
මිණි පහනක් සේ දිදුලයි
මට දිරි දෙන බුදුන් ඇයයි
මගෙ ආදර අම්මා .....

# මගේ අප්පච්චි

දවස පුරා අපි වෙනුවෙන්
මහන්සි වී වැඩ  කරනා
මගේ ලොවේ විරුවා ඔබයි
මගෙ අප්පච්චි …..

ඉගෙනුම් වැඩ  ගැන සොයනා
ලෙඩ  වූ විට ළඟ සිටිනා
හිස අත ගා මා සනසන
මගෙ අප්පච්චි ….

මට කරදරයක් වූ විට
විගසින් මා වෙත පැමිණෙන
මා තුරුලට ගෙන සිඹිනා
මගෙ අප්පච්චි …..

යෝධ  හයිය ඔබයි මගේ
සෙවණැල්ලත් ඔබයි මගේ
සුදු දෝණී මමයි ඔබේ
මගෙ අප්පච්චි …..

# මගේ ගෙවත්ත

හිමිදිරි උදයේ පිපෙනා රෝස පිච්ච මලී
මුලු මිදුලම හැඩකරනා ඔබයි සුවඳ දිදී
දකිනා අය ඉල්ලනවා මගෙන් ඔබව නිතී
මගේ ගෙදර ලස්සන කරනා මනමාලී

ඇඹුල් පේර ජමනාරං ජම්බු හරි ගොඩයි
අඹ අනෝදා ගස්වල අතු පල බරව තිබෙයි
ලේන් ගිරා බටිති මලිති නිතර සැරිසරයි
මගෙ ගෙවත්ත සත්තු වත්ත වගේ මට හැඟෙයි

මුකුණුවැන්න කතුරුමුරුංගා පලා ගොඩයි
ඉස්කෝලේ පොළට ගියා මට හරි ලාභයි
ලැබුණු මුදල් ඉතුරු කරන්නට හරි ආසයි
පහට ආපු මගෙ පොත් ටික ගත්තෙ එයින්මයි

හරි ආසයි ඉන්නට මම මගෙ ගෙවත්තේ
සිත සැනසෙයි ගත සැනසෙයි මගේ ගෙවත්තේ
මල් පලතුරු පලා ජාති මගේ ගෙවත්තේ
ලස්සන සරුවට වැඩිලා මගේ ගෙවත්තේ

# මගේ නංගී

මගේ පුංචි සුරතලා
චූටි මගේ නංගියා
දවස තිස්සේ දඟකර කර
චනුලි  මගේ නංගියා ……

පාන්දරින් අවදි වෙලා
ගේ හැම තැන දුව පැනලා
කටක් දෙකක් බත් කාලා
දුවන නංගියා …..

මා එනතුරු මග බලමින්
අත්තම්මා සමග ඉතින්
මා එනවිට සතුටු වෙනා
මගේ නංගියා …..

පුංචි මගේ තනි ලෝකයෙ
පාලු ගතිය මකාලන්න
සුරංගනා ලෝකෙන් ආ
මගේ නංගියා …..

# මගේ යෙහෙළිය

දහම් පාසලේ මා ළඟ
එකටම හිඳ අකුරු කරන
මගෙ හිතවත් මිතුරිය ඈ
තෙරුණී  සමාධි …..

මා පාසල් නොගිය විට දි
ඇමතුම් දී සොයා බලන
සොහොයුරියක් වාගේ මට
තෙරුණී  සමාධි …..

හොඳ ගුණදම් ඇයට තිබෙයි
කරුණාවන්තිය ඇයමයි
මගේ හොඳම මිතුරි ඇයයි
තෙරුණී සමාධි …..

අපි දෙන්නා හමු වුණු විට
රසවත් වෙයි කතා බොහොම
මගේ හොඳම යෙහෙළි ඔබයි
තෙරුණී  සමාධි ……

# රාත්‍රිය

ඉද්ද වැටෙයි කුමුදු පිපෙයි රාත්‍රිය වෙලේ
බට්ති නිදයි වවුලො නටයි රාත්‍රිය වෙලේ
මුලු පරිසරයම අඳුරුයි රාත්‍රිය වෙලේ
පිනි කැට ටික ටික වැටෙනව රාත්‍රිය වෙලේ

සේපාලිකා මල් සුවඳයි රාත්‍රිය වෙලේ
අහසේ තරු කැට දිදුලයි රාත්‍රිය වෙලේ
බකමූණෝ එහේ මෙහේ රාත්‍රිය වෙලේ
හරි ලස්සන රූප ගොඩයි රාත්‍රිය වෙලේ

අප්පච්චී ගෙදර ඇවිත් රාත්‍රිය වෙලේ
මුලු පවුලම එකට ඉඳී රාත්‍රිය වෙලේ
ගෙදර අයට සතුට ගෙනෙයි රාත්‍රිය වෙලේ
සතුටු සිතින් කල් ගෙවනවා රාත්‍රිය වෙලේ

අත්තම්මගෙ කතා අහන් රාත්‍රිය වෙලේ
සුව නින්දට යනවා මම රාත්‍රිය වෙලේ
අඳුරට මම බයවෙනවා රාත්‍රිය වෙලේ
සැවොම නිදහසේ ඉන්නේ රාත්‍රිය වෙලේ

# මගේ සුරතලා

මම තනියෙන් හිටපු  කාලෙ
අඩලා ඔයා ගෙන්නගත්තෙ
සුරතල් බලු පැටියා ඔයා
මගෙ ආදර ටිමී .....

මගෙ තනිකම නැති කරාලු
හැම තැන පැන පැන දිව්වලු
ඔයා ගෙදර දඟ මල්ලලු
මගෙ ආදර ටිමී ......

ඔයාට ලෙඩ දුක්  වූ විට
තනියෙන් ඇඬුවානේ  මම
ඔයා දන්නෙ නැනෙ  නේද
මගෙ ආදර ටිමී .....

සොරෙක් පැනපු සැණින් ඔයා
බුහ් බුහ් ගා අපට  කියයි
ගෙදර රකින මුරකරුවා
මගෙ ආදර ටිමී .....

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත් කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් 'හේමමාලා උපහාර' ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටු කළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරු භවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමේතුමන් ඇතුලූ ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)